(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2(4).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2010 දෙසැම්බර් මස 22 වැනි බදාදා

## 2011 ජනවාරි මස 04 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0848/’10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුත්තලම් දිස්ත්‍රික්කයේ ඇති එකම කෘෂි ආර්ථික මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොරොච්චෝල ප්‍රදේශයේ බවත්;

(ii) කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සාරවත් බවක් නොමැති දීර්ඝ වැලිබිම් තීරුවකින් වැසී ඇති බවත්;

(iii) එම ප්‍රදේශයේ ගොවීන් විසින් යූරියා ඇතුළු රසායනික පොහොර යොදා සාරවත්කර ගනු ලබන එම අසාරවත් වැලිබිම් තීරුව තුළ ලංකාවට අවශ්‍ය රතුළූණු, එළවළු, පළතුරු අවශ්‍යතාවයෙන් 1/3ක් පමණ අතිසාර්ථකව නිෂ්පාදනය කරන බවත්;

(iv) එසේ වුවද වී වගාවේදී රජය මඟින් යූරියා ඇතුළු අනෙකුත් පොහොර සඳහා ලබා දෙන සහනාධාරය කල්පිටිය ගොඩ ගොවිතැන් කරන ගොවීන්ට නොලැබෙන බවත් ;

එතුමා දන්නෙහිද?

(ආ) වී වගාව සඳහා ලබාදෙන පොහොර සහනාධාරය අසාරවත් පොළව සමඟ ගැටෙන්නාවූ අති දුෂ්කර කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩ ගොවිතැන් කරන ගොවියන්ටත් ලබාදීම සුදුසු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම් එම පොහොර සහනාධාරය කල්පිටියේ ගොවීන්ටත් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජනවාරි මස 05 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0877/’10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වීරවිල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම සඳහා 2007, 2008, 2009 සහ 2010 වර්ෂවල වැයකරන ලද මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙනයන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය අතහැර දැමීම නිසා ශ්‍රී ලංකා රජයට සිදුව ඇති අලාභය කොපමණද;

(v) එම අලාභය සිදුවීමට වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් කවුරුන්ද;

(vi) ඔවුන්ට එරෙහිව ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0706/'10

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල සමෘද්ධිලාභීන්ට වාර්ෂිකව ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් වර්ෂය තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිට එහෙත්, පසුව ඉවත් කරන ලද සංඛ්‍යාව, එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද පදනම කවරේද;

(iii) එම කාල සීමාවේදී අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම්, ඔවුන්ට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0707/'10

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු නැගෙනහිර පුනරුත්ථාපන සංවිධානය (NERDO—North East Rehabilitation and Development Organisation) නම් සංවිධානයක් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර තිබේද;

(ii) එසේ නම්, ලියාපදිංචි කරන ලද දිනය කවරේද;

(iii) එම සංවිධානය පිහිටුවීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංවිධානයේ කාර්යාලය පිහිටා ඇති ස්ථානය, එහි ප්‍රධානීන්ගේ නම්, කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0883/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, පුල්මුඩේ ප්‍රදේශයේ වසර පනහකට අධික කාලයක් තිස්සේ ගොවිතැන් කටයුතුවල යෙදෙන මුස්ලිම් ගොවීන්ගේ ඉඩම් සඳහා මෙතෙක් බලපත්‍ර ලබාදී නොමැති බවත්;

(ii) එම තත්ත්වය නිසා තම ගොවිබිම් එළිපෙහෙළි කිරීමේදී සහ එම බිම්වල ගොවිතැන් කටයුතු කිරීමේදී එම ජනතාවට විවිධ බාධා ඇතිවී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එබැවින් එම ගොවීන්ගේ ඉඩම් සඳහා කඩිනමින් බලපත්‍ර ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0886'/10

ගරු විජිත හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, පැපිලියවල, පල්ලේගම පිහිටි බප/ගම්/ආනන්ද විද්‍යාලයේ වර්ෂ 2011 සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත්කර ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණ පැවැත් වූ දිනයන් කවරේද;

(ii) සුදුසුකම් ලද හා නොලද අයදුම්කරුවන්ගේ නම්, ලිපිනයන්, අදාළ ගනය හා ලකුණු වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ අදාළ චක්‍රලේඛයට අනුව අයදුම්පත්‍රයේ සඳහන් ලියාපදිංචි ඡන්ද හිමි නාම ලේඛනවල තොරතුරු සනාථ කර ගැනීම පිණිස ග්‍රාම නිලධාරී ලිපියක් අවශ්‍ය වන්නේද යන්නත්;

(ii) ග්‍රාම නිලධාරී ලිපියක් නොතිබූ පමණින් චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සනාථ කිරීමේ ලිපි ලේඛන පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැකියාව තිබේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ග්‍රාම නිලධාරී ලිපියක් නොතිබූ ඇතැම් අයදුම්කරුවන් නැවත සම්මුඛ පරීක්ෂණයට වෙනත් දිනයක කැඳවා තිබූ බවත්;

(ii) ඒ සඳහා විධිමත් දැනුම් දීමක් කර නොතිබූ බැවින් එක් අයදුම්කරුවෙකු අසාධාරණයට ලක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මේ අනුව අසාධාරණයට ලක් වූ එම අයදුම්කරුට සාධාරණය ඉටුකර දීමටත්;

(ii) මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්;

එතුමා පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජනවාරි මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0570/'10

ගරු කරු ජයසූරිය මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රද්දොළුගම නිවාස සංකීර්ණයේ ඉතිරිව ඇති බිම් කැබලි විකිණීමට නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ සැළසුමක් එහි නිවාසලාභීන් අතිගරු ජනාධිපතිතුමා වෙත කළ පැමිණිල්ලක් අනුව අත්හිටවූ බවත්;

(ii) ඒ සම්බන්ධව ජනාධිපති විමර්ශණ අංශය කළ පරීක්ෂණයේ නිර්දේශය ජනාධිපති ලේකම් විසින් එවකට නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වෙතද, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු අංක SP/4/2/4/2/1 හා 2006/02/28 දිනැති ලිපියෙන් දන්වා ඇති බවත්;

(iii) එම ලිපියේ (කෙටියෙන්) "ඉතිරිව ඇති කුඩා බිම් කැබලි වසර 23 පමණ කාලයක් එහි නිවැසියන් භුක්ති විද ඇති හෙයින් ඔවුනට විකිණීමෙන් පවරාදීමට අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කර තිබිණ. ජනාධිපති විමර්ශන අංශයේ නිර්දේශය අනුව රද්දොළුගම නිවාස සංකීර්ණය වටා යාමට ඇති මාර්ගය 1820 බිම් කොටසෙන් වෙන් කිරීම සහ 1819 බිම් කැබැල්ල යාබද නිවැසියන් වෙත විකිණීමෙන් පවරාදීම සුදුසු බවත් දන්වමි" යන්න සඳහන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අතිගරු ජනාධිපතිතුමාගේ ඉහත නියෝගය නොපමාව ඉටුකර දීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0843/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අදියර තුනකින් සමන්විත නොරොච්චෝල ගල් අඟුරු තාප බලාගාරයේ පළමු පියවරේ වැඩ කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එම බලාගාරයේ විදුලි ඵලදායිතාවය මත සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන භූමි ප්‍රමාණය කවරේද;

(iii) මෙම විදුලි ව්‍යාපෘතිය විවෘත කොට ආරම්භ කිරීමට බලාපොරොත්තුවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම විදුලි ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ ජනතාවට යහපතක් සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම ප්‍රයෝජනයන් පිළිබඳව කරුණු සවිස්තරාත්මකව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජනවාරි මස 18 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0239/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නේහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0317/'10

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා විදුලි බල මණ්ඩලයට ලැබිය යුතු මුළු ණය මුදලේ ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිම මුදලක් ගෙවිය යුතු ණය ගැතියන් දස දෙනාගේ නම් කවරේද;

(iii) ලංකා විදුලි බල මණ්ඩලයේ අධික ණය බර හේතුවෙන් එය ලබාගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(v) ලංකා විදුලිබල මණ්ඩලය තම ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ලංකා විදුලි බල මණ්ඩලය වැඩිම මුදලක් ගෙවිය යුතු ණය හිමියන් දස දෙනාගේ නම් කවරේද; සහ

(vii) පසුගිය වසර 06 තුළ එම මුදල් ලැබිය යුතුව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදුලි මිල ඉහළ යැමට හේතුවී ඇත්තේ ලංකා විදුලි බල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව සහ එය විසින් ලබාගෙන ඇති අධික ණය බව සත්‍යයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත කොන්දේසි කවරේද; සහ

(ii) ලංකා විදුලි බල මණ්ඩලය එම කොන්දේසි ඉටුකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0624/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'10

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2005 සිට 2010 අගෝස්තු දක්වා කාල සීමාවේදී කොරියානු රජය මඟින් ශ්‍රී ලංකාවට ලබා දුන් විදේශ රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා අවස්ථාවක් ලබා ගැනීමට පුද්ගලයකු විසින් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම රැකියා සඳහා පිටත්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොරියානු රැකියාවක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචි වී සිටින සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ කොරියානු රැකියා අපේක්ෂකයෙකු ගේ ලියා පදිංචිය වලංගුවන කාල සීමාව කවරේද;

(ii) ඉහත ලියාපදිංචිය අවලංගු වූ රැකියා අපේක්ෂකයෙකු කොරියාවේ රැකියාවක් ලබා ගැනීම සඳහා නැවත අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මේ සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචිවී සිටින රැකියා අපේක්ෂකයින්හට ප්‍රමුඛත්වය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/’10

ගරු එම්.ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2006 වර්ෂයේ පැවැත්වූ බවත්;

(ii) එම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 16,000ක් අතරින්, 1000 ක පමණ පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ බවත්:

(iii) එම පිරිසෙන් 550 දෙනෙකුට 2007 වර්ෂයේ අප්‍රියෙල් 01 වන දින සිට පත්වීම් ප්‍රදානය කළ බවත්;

(iv) එම පත්වීම්ලාභීන් අතර මෙම විභාගයට අදාළව 2006 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයේ සඳහන් දිනට උපාධි සහතිකය නොමැති අය සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බදු නිලධාරීන් ලෙස ඉහත පත්වීම් ලැබූ එක් එක් අපේක්ෂකයාගේ නම, ලිපිනය සහ ලබා ගත් ලකුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006.12.08 දින පෙරවරු 9.30ට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ජා-ඇල නැගෙනහිර, තුඩැල්ල, අංක 76/සී, හි පදිංචි, ඩබ්ලිව්. ඒ. එස්. එම්. සෝයිස් මහත්මිය එම විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0781/’10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට නැගෙනහිර පළාත තුළ පදිංචි, ත්‍රිවිධ හමුදා, පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බළකාය සහ සිවිල් ආරක්ෂක සේවයේ යෙදී සිටියදී තම ස්වාමි පුරුෂයන්, අහිමිවූ කාන්තාවන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැන්දඹු කාන්තාවන් වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභසාධන සේවාවන් කවරේද;

(iii) ඔවුන්ගේ දරුවන් සම්බන්ධයෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0791/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

(iv) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(v) ගුරු ඌනතාවයක් පවතින විෂයයන් කවරේද;

(vi) ගුරු ඌනතා පවතින ඉහත පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඇමති ආරක්ෂක අංශ නිලධාරීන් යොදවා ඇත්තේ වෙන කවුරුන් වෙනුවෙන්ද;

(iii) එසේ ලබාදී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා හැර අනෙකුත් අයට මේ වන විට ලබාදී ඇති ඇමති ආරක්ෂක අංශ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ ආරක්ෂාව තවමත් ලැබෙන පරාජිත අපේක්ෂකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද සහ ඔවුන් කවර ප්‍රදේශවලින්ද;

(iii) එලෙස යොදවා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සඳහා ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ, විනිසුරුවන්ගේ ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරී සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0525/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට ධීවර වරාය භාවිතාකරන පාරම්පරික සහ සංක්‍රමණික ධීවර කාර්මිකයෝ විශාල සංඛ්‍යාවක් මේ වන විට ඉමහත් දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත්;

(ii) එම දුෂ්කරතාවයන් අතර ධීවර වරාය වැලිවලින් ගොඩවීම, සාමාන්‍ය ධීවරයින්ගේ කුඩා බෝට්ටු හා ඔරු නතරකර තැබීමට ඉඩ පහසුකම් නොතිබීම, සංක්‍රමණික බහුදින යාත්‍රාවලට වරාය සීමාවීම, වරාය අධිකාරියේ නිලධාරීන් විසින් ධීවර කාර්මිකයින්ගෙන් විවිධ ක්‍රම මගින් මුදල් ලබාගැනීම, නාවික හමුදා නිලධාරීන්ගේ පරීක්ෂාවන් නිසා නියමිත වේලාවට රැකියාවට යාමට නොහැකිවීම සහ මුහුදේදී ධීවරයින් නාවික හමුදා නිලධාරීන්ගේ විවිධ බාධාවන්ට ලක්වීම ආදී කරුණු ප්‍රධාන වන බවත්;

(iii) ධීවර කර්මාන්තයේ නියැලුනු වර්ෂ 100 - 150 ක අත්දැකීම් ඇති පාරම්පරික ධීවරයින්ගේ අදහස් නොවිමසා මෙම ධීවර වරාය ඉදිකිරීම ඉහත ගැටලුකාරී තත්ත්වයන්ට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අවාසනාවන්ත තත්ත්වයෙන් ධීවර ජනතාව මුදා ගැනීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0724/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින සමෘද්ධි ණය ලබාගත් සංඛ්‍යාව;

(ii) එම ණය ලබා දී ඇති පොලී අනුපාතිකය;

(iii) ණය ලබා දීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත;

(iv) මේ වන විට අය කර ගැනීමට ඇති මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ණය ලබාගත් සමෘද්ධිලාභීන්ගෙන් ණය අයකර ගැනීමේදී නිලධාරීන් අත්තනෝමතික ලෙස කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0782/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ පදිංචි උපතින්ම අබාධිත සහ විවිධ අනතුරු හා රෝගාබාධවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආබාධිත පුද්ගලයන් සඳහා රජය මගින් සලසනු ලබන සහන සේවාවන් කවරේද;

(iii) ඒ සඳහා රජය වාර්ෂිකව වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0792/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතා පවතින ඉහත පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 ජනවාරි මස 18 වැනි අඟහරුවාදා)**

0664/'10

ගරු අනුර දිසානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ආරම්භයේදී, වී අලෙවි මණ්ඩලය සතුව තිබූ,

(i) ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගබඩාව පිහිටි ස්ථාන කවරේද;

(iii) එම ගබඩාවල ධාරිතාව වෙන වෙනම කොපමණද;

(iv) එක් එක් ගබඩාවේ සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වාහන සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද වන විට රජය සතු,

(i) වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) වී ගබඩා පිහිටි ස්ථාන කවරේද;

(iii) එක් එක් ගබඩාවේ ධාරිතාව හා සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වී මිළදී ගැනීම සඳහා වෙන් කළ වාහන වර්ග සහ සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 5 තුළ,

(i) යල හා මහ කන්නවලදී එක් එක් ගබඩාව මිලදී ගත් වී ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වී ගැණුම් මිල කොපමණද;

(iii) වී විකුණුම් මිල කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ මිලදීගත් වී තොගවලින් විනාශ වූ වී ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0665/’10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළ, යල සහ මහ කන්නවලදී, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) කෘෂිකාර්මික භෝග වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් අපනයන භෝග වගා කළ හෙක්ටයාර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අපනයන භෝග වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 10 තුළ, එක් එක් වර්ෂයේ,

(i) වගාකරන ලද එක් එක් කෘෂිකාර්මික භෝගවලින් ලද අස්වැන්න කන්න අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් අපනයන භෝගයේ වාර්ෂික අස්වැන්න සහ එම භෝගයන්හි අපනයන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම භෝගවල සමස්ථ අපනයන වටිනාකම කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0666/’10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 1977 වන විට තිබූ රජයේ ගොවිපලවල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ගොවිපලේ,

(i) නම, ගොවිපල පිහිටුවීමේ අරමුණ සහ කරන ලද කාර්යභාරය කවරේද;

(ii) විශාලත්වය හා සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ලාභ ලැබූ වර්ෂ, ලැබූ ලාභය, ලාභ ලැබූ අංශ හා ලාභ ලැබූ වර්ෂ කීපයක නිෂ්පාදන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගොවිපලවල් අතරින් පෞද්ගලික අංශයට පැවරූ ගොවිපලවල් කවරේද;

(ii) ඒවා පවරන ලද පුද්ගලයින් හා වර්තමාන හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම පැවරීම් කළ දිනයන්, මිල ගණන් හා පැවරුමේ මූලික කොන්දේසි කවරේද;

(iv) දැනට පෞද්ගලික ගොවිපලවලින් ඉටු කෙරෙන කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) දැනට රජය සතු ගොවිපල්වල,

(i) ඉටු කෙරෙන කාර්යයන් කවරේද;

(ii) සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ ලැබූ ලාභ හෝ අලාභ ප්‍රමාණ කවරේද;

(iv) පසුගිය වර්ෂයේ නිපැයූ එක් එක් නිෂ්පාදනයන්හි අගයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0667/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට කෘෂිකර්මාන්තයට අදාළව මධ්‍යම ආණ්ඩුවේ හා පළාත් සභා තුළ පිහිටුවා ඇති රාජ්‍ය ආයතන (දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරි) කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් ආයතනය,

(i) පිහිටුවූ දිනයන්, පිහිටුවීමේ අරමුණු සහ ඉටු කරනු ලබන කාර්යය;

(ii) පිහිටුවා ඇති තනතුරු හා ඒ ඒ තනතුරේ අද වන විට සිටින සේවක සංඛ්‍යාව;

(iii) ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය සහ ඒවායේ සංවිධාන ව්‍යුහය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අද වන විට කෘෂිකර්මාන්තයට අදාළව පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය පිහිටු වූ අය සහ ඒවාට ප්‍රතිපාදන ලබා දෙන අය කවුරුන්ද:

(iii) මේ වන විට එම සංවිධාන මඟින් වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කවරේද;

(iv) එම එක් එක් ආයතනයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0669/'10

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහා වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාරිමාර්ගය අයත් ආසනය කුමක්ද;

(iii) එම එක් එක් වාරිමාර්ගයේ නම සහ ජල මූලාශ්‍රය කවරේද;

(iv) ජල පෝෂිත ප්‍රමාණය සහ එහි ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් වාරිමාර්ගය,

(i) ඉදිකිරීම් ආරම්භ කළ වර්ෂය;

(ii) අවසන් කළ වර්ෂය;

(iii) ජනතා අයිතියට පැවරූ දිනය;

(iv) නිමකිරීම සඳහා වැය කළ මුදල;

කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 20 තුළ, එම එක් එක් වාරිමාර්ගය වෙනුවෙන්,

(i) ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) මුදල් වෙන් කළ වර්ෂයන් කවරේද;

(iii) ඉටු කරන ලද කාර්යය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ඉහත එක් එක් වාරිමාර්ගයට අදාළව,

(i) අස්වද්දන ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ දහය තුළ යල සහ මහ කන්නවල වෙන් වෙන් වශයෙන් වගා කළ ඉඩම් ප්‍රමාණය;

(iii) පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0776/’10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ ආචාර්ය දර්ශන වික්‍රමසිංහ මහතාට එරෙහිව ගොනු කොට තිබූ සියලු චෝදනාවලට නිවැරදිකරු බව සනාථ වී තිබුණ ද විශ්වවිද්‍යාල සභාවෙන් ගත් තීරණයකට අනුව එතුමා සේවයෙන් පහ කොට ඇති බවත්;

(ii) ආචාර්ය වික්‍රමසිංහ මහතා විසින් ඉහත තීරණය අභියාචනාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කළ අතර, එම තීරණය අවලංගු කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කර ඇති බවත්;

(iii) තම රැකියාව අහිමි වීමට හේතු වූ ද්වේෂ සහගත චෝදනා ඉදිරිපත් කරමින් එම විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මීරානි වීරසූරිය තමන්ට සිදු කළ හානි පිළිබඳව ආචාර්ය වික්‍රමසිංහ මහතා මාතර දිස්ත්‍රික් උසාවියේ පෞද්ගලික පැමිණිල්ලක් කර ඇති බවත්; සහ

(iv) මෙම පෞද්ගලික නඩුවේදී පවා මහාචාර්ය වීරසූරිය සඳහා සේවය ලබාදෙන නීතිඥවරුන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය ගෙවීම් සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ බලධාරීන් ගන්නා ඉහත ක්‍රියාමාර්ග සාධාරණීකරණය කළ හැකිද යන්න; සහ

(ii) ඉහත කාරණය පිළිබඳව විමසා බැලීමට විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට උපදෙස් දුන්නේද යන්නත්; අනාගතයේදී මෙවන් සිදුවීම් වැළැක්වීමට යෝග්‍ය පියවර ගන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0777/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයට 2004, 2005, 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා ලැබුණු විදේශ පර්යේෂණ සඳහා වූ ප්‍රදානයන්හි වටිනාකම් සහ ඒවා ලැබුණු මූලාශ්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වෛද්‍ය විද්‍යා පීඨය විසින් එම අරමුදල් උපයෝජයනය කළ ආකාරය කවරේද;

(iii) මෙම ආධාර ලැබීම් සම්බන්ධව සහ මෙම ආධාර භාවිතා කරමින් කරන ලද පර්යේෂණවල සොයාගැනීම් පිළිබඳව වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ සභාව, සනාථන සභාව සහ අධ්‍යයන අධිකාරිය දැනුවත් කරන ලද්දේ ද;

(iv) නොඑසේ නම්, අදාළ අධිකාරීන් දැනුවත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 1978 අංක 160 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය අනුව සහ රජයේ අනෙකුත් මූල්‍ය රෙගුලාසිවලට අනුව මෙම අරමුදල් විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ඇතුළත් කරන ලද්දේ ද;

(ii) නොඑසේ නම්, ගිණුම්ගත නොකිරීමට හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජනවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0240/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) මෙම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0456/'10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ නගරය තුළ තිබූ පදික වෙළෙඳුන් සතු සියලුම වෙළෙඳසැල් කඩා දැමීමේ වැඩ පිළිවෙළක් රජය ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒවා ඉවත් කරන ලද දිනය සහ ඒවා ඉවත් කළේ කුමන හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සියලුම වෙළෙඳසැල් මේ වන විට සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒවා ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) තවමත් වෙළෙඳසැල් පවත්වාගෙන යන පදික වෙළෙඳුන් සිටින්නේ නම්, එම වෙළඳාම නීත්‍යානුකූල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉවත් කරන ලද පදික වෙළෙඳුන් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට විකල්ප ස්ථාන ලබා දී තිබේද;

(iii) ඔවුන්ගේ නම් සහ ඔවුන්ට ලබාදී ඇති විකල්ප ස්ථාන කවරේද;

(iv) කොළඹ නගරය හැර වෙනත් ප්‍රදේශවලත් මෙම ගැටලුව පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) දේශපාලන පළිගැනීමක් සඳහා මෙය සිදුකළ බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0530/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, මහඔය - චෙන්කලඩි මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු වසිදුකරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම් විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0660/'10

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සුමනසේන රාමසිංහ මහතා දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු තනතුර, දිනය, සේවා කාලය, විශ්‍රාම ගිය දිනය හා එදිනට දැරූ තනතුර කවරේද;

(ii) ඔහු ලබාගෙන ඇති සේවා දිගු සංඛ්‍යාව හා අදාල වර්ෂයන් කවරේද;

(iii) සේවා දිගු නිර්දේශ කළ නිලධාරියාගේ නම, තනතුර හා ලිපිනය කවරේද;

(iv) සේවා දිගු සඳහා සපුරාලිය යුතු නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාමසිංහ මහතා මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වූ දිනය කවරේද;

(ii) මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකුට හිමිවන වරප්‍රසාද හා පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රාමසිංහ මහතාගේ සේවා කාලය තුළදී කිසියම් වරදක් සඳහා චෝදනා පත්‍ර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළව විනය පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) ඒ මහතා කිසියම් වරදකට වැරදිකරුවී යම් දඬුවමක් ලබා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රාමසිංහ මහතාට විශ්‍රාම වැටුප ලබාදීමට පත්වීම් බලධාරියා විසින් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) ඊට අදාළ නීතිමය තත්ත්වය කවරේද;

(iii) පරිපාලනමය අඩුපාඩුවක් නිසා රාමසිංහ මහතාගේ විශ්‍රාම වැටුප් සැකසීම ප්‍රමාද වී ඇත්නම්, එම විශ්‍රාම වැටුප සකස්කර දෙනු ලබන කාල රාමුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0783/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2005 ජනවාරි සිට 2010 මාර්තු 31 දින දක්වා නැගෙනහිර පළාතෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අලුතින් බඳවා ගන්නා ලද භටයන්ගේ සංඛ්‍යාව හා බඳවා ගන්නා ලද දිනයන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එසේ බඳවාගත් සිවිල් ආරක්ෂක භට සංඛ්‍යාවෙන් විවිධ අනතුරුවලට ලක්ව මියගිය සහ අබාධිත තත්ත්වයට පත්ව ඇති සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මියගිය සිවිල් ආරක්ෂක භටයන්ගේ කලත්‍රයන් හා දරුවන් වෙනුවෙන් සහ ආබාධිත තත්ත්වයට පත්වූ අය වෙනුවෙන් රජය මගින් ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0793/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිහගොඩ අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට (100) අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

(iv) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(v) ගුරු ඌනතාවයක් පවතින විෂයයන් කවරේද;

(vi) ගුරු ඌනතා හා ගුරු අතිරික්තයක් පවතින පාසල් අතර ගුරු තුලනයක් සිදු කිරීමට කටයුතු කරන්නෙහිද;

(vii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0835/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1995 වර්ෂයේ සිට වතු නිවාස අමාත්‍යාංශය සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් වතු සේවකයන් සඳහා වතු තුළ නිවාස ඉදි කර ඇති බවත්;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉහත කී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද බවත්;

(iii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වතු සේවකයනට නිවාස ණය ලබා දෙන ලද බව සහ ඔවුන්ගේ වැටුප්වලින් එකී ණය වාරික වශයෙන් අයකරගෙන එම ණය වාරික නිවාස සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කරන ලද බවත්;

(iv) ණය මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිම කළ විට නිවාසවල ඔප්පු ලබා දෙන බවට සේවකයන්ට පොරොන්දු වූ බවත්;

(v) වතු සේවකයන් කිහිපදෙනෙකු ඉහත කී ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කොට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කී නිවාස ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන්ට ඔප්පු ලබා දීමට පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එලෙස ඔප්පු ලබා දෙනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0844/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අතිගරු ජනාධිපතිතුමා විසින් අප රට ස්වයංව නගා සිටුවීමේ දැඩි අධිෂ්ඨානය පෙරදැරිව නෝරොච්චෝල තාප බලාගාරය ආරම්භ කළ බවත්;

(ii) එම තාප බලාගාරය ආරම්භ කිරීම සඳහා නොරොච්චෝල ප්‍රදේශය අවට පදිංචිව සිටි ජනතාව අතිගරු ජනාධිපතිතුමා කෙරෙහි දැඩි විශ්වාසයකින් හා බලාපොරොත්තුවකින් යුතුව පොරොන්දු මත ඉවත් වූ බවත්;

(iii) එම අවතැන් ජනතාවට නිවාස, වගාවන්, ඉඩම්, විදුලිය, මංමාවත්, පොදු ක්‍රීඩාපිටිය, දේවස්ථාන, ළදරු පාසල් සහ සියලුම සමාජ අවශ්‍යතාවයන් මෙම විදුලි ව්‍යාපෘතිය මඟින් නැවත ලබා දීමට පොරොන්දු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ලබා දුන් පොරොන්දු අනුව මේ වන විට එම ජනතාව වෙනුවෙන් ඉටුකර ඇති වැඩකටයුතු කවරේද;

(ii) මෙතෙක් ඉටුනොවූ වැඩ කටයුතු කඩිනමින් ඉටුකර දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0885/'10

ගරු එම්.ටී. හසන් අලි මහතා— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට —

(අ) (i) කොළඹ 10, මාලිගාවත්ත පෙදෙස, අංක 129/ඒ/22 දරන නිවසේ පදිංචි මොහොමඩ් රිසාම් මහතා වයස අවුරුදු 48 ක් වූ ස්ථිර ආබාධිත තත්වයට පත්ව ඇති දිළිඳු අයෙකු බවත්;

(ii) ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති රිසාම් මහතාට හිමිවිය යුතු සමෘද්ධි සහනාධාරය ලබා දීමට එම ප්‍රදේශයේ සමෘද්ධි සංවර්ධන නිලධාරියා මෙතෙක් කටයුතු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රිසාම් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට නොපමාව සමෘද්ධි සහනාධාර හිමිකම ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0526/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිහිටි කිරින්ද ධීවර වරායේ ඇති මෝය කට, එම ප්‍රදේශයේ ධීවර කාර්මිකයින් සහ සංක්‍රමණික ධීවර කාර්මිකයින් විශාල සංඛ්‍යාවක් තම ධීවර යාත්‍රා මුහුදට රැගෙන යාම සහ මුහුදේ සිට වරාය ගැටියට ඇතුළු වීම සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම මෝයකට නිරන්තරයෙන් වැලිවලින් වැසීයාම නිසා ධීවර කාර්මිකයින් ඉමහත් පීඩාවට පත්වන බවත්;

(iii) ඒ අනුව විශාල මුදලක් වැය කොට ඉදිකරන ලද මෙම ධීවර වරාය තුළින් ධීවර කාර්මිකයන් බලාපොරොත්තු වූ සංවර්ධනය ඉටුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිරන්තරයෙන් වැලිවලින් වැසීයන එම මෝය කටෙහි වැලි ඉවත් කිරීමට රජයට වැයවන වියදම කොපමණද;

(ii) මෙම ධීවර වරාය ඵලදායී ලෙස ධීවරයින්ට පරිහරණය කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රමයන් තුළින් සංවර්ධනය කළහැකි සැලැස්මක් තිබේද;

(iii) එසේ නම්, එම සැලැස්ම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) මීට අදාළව කිසිදු සැලැස්මක් සකස්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0592/'10

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රට තුළ ක්‍රියාත්මක වන සියළු ගුවන් විදුලි ආයතනවල සහ එම ගුවන් විදුලි ආයතනවල හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(ii) එම ගුවන් විදුලි ආයතන වෙත නිකුත්කොට ඇති සංඛ්‍යාත සංඛ්‍යාව හා එම සංඛ්‍යාත කවරේද;

(iii) එම එක් එක් ආයතන ක්‍රියාත්මකවීම ආරම්භකළ දිනයන් කවරේද;

(iv) එම ආයතනවල සේවය කරන සේවක සංඛ්‍යාව කවරේද; සහ

(v) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් ගුවන් විදුලි ආයතන විසින් ගෙවා ඇති බදු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0725/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැදුරු ඔය යෝජනා ක්‍රමයට තම ඉඩම් යටවීමෙන් අවතැන් වන ජනතාව වෙනුවෙන් වන්දි ලබා දීමේ කටයුතු අවසන් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජය විසින් ලබා දීමට පොරොන්දු වූ පහසුකම් කිසිවක් ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දුන් ප්‍රදේශයේ නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, අදාළ පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම අවතැන් ජනතාවට ලබා දුන් විකල්ප ඉඩම්වල අනවසර පදිංචිකරුවන් සිටින්නේද;

(iii) එවැනි අනවසර පදිංචිකරුවන් සිටින්නේ නම්. එම ඉඩම්වලින් ඔවුන් ඉවත් කිරීම සඳහා මැදිහත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0784/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) කිරි ගොවීන් සංඛ්‍යාව;

(ii) මාසිකව නිෂ්පාදනය කරනු ලබන කිරි ලීටර් සංඛ්‍යාව;

(iii) රජය මඟින් මිලදී ගනු ලබන කිරි ලීටර් ප්‍රමාණය;

(iv) කිරි ගව පාලනය සඳහා රජය මඟින් ලබාදෙන සහනාධාරයන් සහ ඒ සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය නංවාලීම සඳහා ඉදිරියේදී රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ සටහන් කවරේද;

(ii) ඒ සඳහා එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රජය වැය කිරීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0795/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතර දිස්ත්‍රික්කයේ, රංචාගොඩ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කන්දබඩපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) අතිරේක රෙජිස්ට්‍රාර් ධූරය සඳහා අයදුම්පත් කැඳවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අයදුම්පත් කැඳවනු ලැබූ දිනය කවරේද;

(ii) එම ධූරය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iii) මෙම ධූරය සඳහා අයදුම් කළ සංඛ්‍යාව කවරේද;

(iv) අයදුම්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත තනතුරට අදාළ සම්මුඛ පරීක්ෂණ මේ වන විට පවත්වා තිබේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් අයදුම්කරුවන් ලබාගත් ලකුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අයෙකු එම ධූරය සඳහා තෝරාගෙන තිබේද;

(iv) එසේ නම්, එම තැනැත්තාගේ නම කුමක්ද;

(v) නොඑසේ නම්, සුදුසුකම්ලත් අයෙකු මෙතෙක් පත් නොකිරීමට හේතුව කවරේද;

(vi) තනතුර සඳහා අයෙකු පත් කරන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0854/’10

ගරු අජිත් කුමාර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010 ජුනි 30 වන විට වයඹ පළාතේ වාර්තාගත අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2009 වර්ෂයේ සහ 2010 ජුනි 30 දක්වා වයඹ පළාත තුළ අලි මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගොස් තිබෙන අලි ඇතුන් සංඛ්‍යාව හා මිනිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මියගිය පුද්ගලයින් සඳහා වන්දි ගෙවීමට කටයුතු කොට තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වයඹ පළාත තුළ වනජීවී දෙපාර්තමේන්තුවේ,

(i) කාර්ය මණ්ඩලය සහ සේවා ස්ථාන;

(ii) කාර්ය මණ්ඩල සඳහා සපයා ඇති රථ වාහන සංඛ්‍යාව;

(iii) කාර්ය මණ්ඩල සඳහා 2009/2010 වර්ෂවලදී වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වයඹ පළාත තුළ පවතින අලි මිනිස් ගැටලුව අවම කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2011 ජනවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා)

0670/’10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළදී,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් ආනයනය කරන ලද කෘෂි කර්මාන්තයට අදාළ පළිබෝධනාශක (කෘමිනාශක / වල්නාශක) ප්‍රමාණය කවරේද;

(ii) ඉහත දෙපාර්ශ්වය විසින් වාර්ෂිකව ආනයනය කරන ලද එක් එක් කෘමිනාශක හා වල්නාශක වර්ගයේ ප්‍රමාණය, මිල හා ආනයනය කරන ලද රට කවරේද:

කවරේද යන්න වෙන් වෙන් වශයෙන්, එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම් ,ඒ මන්ද?

0671/’10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළදී, රාජ්‍ය හා පෞද්ගලික අංශය මැදිහත්ව,

(i) නිෂ්පාදනය කළ කෘෂිකර්මාන්තයට අදාළ මුළු කෘමිනාශක හා වල්නාශක ප්‍රමාණය එක් එක් අංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වාර්ෂිකව නිපදවූ එක් එක් කෘමිනාශක හා වල්නාශක වර්ගයෙහි ප්‍රමාණය හා වෙළෙඳපොල වටිනාකම රාජ්‍ය හා පෞද්ගලික අංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0672/'10

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළ, කෘෂි කාර්මික අවශ්‍යතාවයන් සඳහා,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශ මඟින් ආනයනය කර ඇති පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත දෙපාර්ශවය විසින් ආනයනය කළ එක් එක් පොහොර වර්ගයේ ප්‍රමාණ, ආනයනය කළ රටවල් හා මිල ගණන් වාර්ෂික පදනම මත වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0673/'10

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළ, කෘෂිකාර්මික කටයුතු සඳහා,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් නිෂ්පාදනය කළ මුළු පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පරිදි නිපදවූ පොහොර ප්‍රමාණය, එක් එක් පොහොර වර්ගය හා නිෂ්පාදනය කළ අංශය අනුව වෙන් වෙන් වශයෙන්, වාර්ෂික පදනම මත කවරේද;

(iii) වාර්ෂිකව රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් නිපදවූ මුළු පොහොර ප්‍රමාණයේ වෙළඳපොළ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0675/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළ,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් වාර්ෂිකව ආනයනය කළ කෘෂිකර්මාන්තයට අදාළ බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පරිදි ආනයනය කළ එක් එක් බීජ වර්ගයේ ප්‍රමාණයන්, වටිනාකම්, ආනයන කළ රටවල් සහ මිල ගණන් රාජ්‍ය හා පෞද්ගලික අංශ අනුව හා වාර්ෂික පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0676/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළ;

(i) වාර්ෂිකව, රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් කෘෂිකර්මාන්තය සඳහා නිෂ්පාදනය කළ එක් එක් බීජ වර්ගයේ ප්‍රමාණයන් එම අංශ අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද ;

(ii) එම බීජවල වෙළඳපොළ වටිනාකම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0760/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2010 ජුලි 29 දින 'ඩේලි මිරර්' පුවත්පතේ පළවූ ලිපියක් මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වයට අදාළ නීතිවල වෙනස්කම් සඳහා උද්ඝෝෂණය කරන රාජ්‍ය නොවන සංවිධාන අපහාසාත්මක ඒකාකෘති කිරීමක නියැළී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) 'විෂම ලිංගිකත්වය යනු යල්පිනූ, අභාවිත ස්වභාවික නැඹුරුවක්' යන මතය නිර්මාණය කිරීමට උත්සාහ දරන පිරිස අතර 'තානාපති නිලධාරීන් කිහිපදෙනෙකු ද' ඇතිබවට වූ සඳහන් කිරීම්, වෙනස්කම් ඇති කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස මුළුමණින්ම ජාතික වූ ශ්‍රී ලංකා නීති කොමිසම මගින්ද නිර්දේශ කර ඇති ක්ෂෙත්‍රයක් තුළ විදේශීය මැදිහත්වීම් පිළිබඳ භීතියක් ඇතිකිරීම සඳහා වූ උත්සාහයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) විෂය මූලිකව විවාද කළ යුතු සහ සාකච්ඡා කළ යුතු ගැටලුවල අවධානය වෙනතකට යොමුකරමින්, විදේශිකයන්ට සහ තානාපති නිලධාරීන්ට එරෙහිව අගතිය නිර්මාණය කිරීමට සැලසුම්කර ඇති මාධ්‍ය විකෘති කිරීම් පිළිබඳ මෙබඳු නිදර්ශන වළක්වාලීමට; සහ

(ii) අගතිය සහ වෛර සහගත අදහස් ප්‍රචාරණය නොකළ යුතු බවට සහ භාෂණයේ නිදහස වගකීමෙන් යුතුව යොදාගත යුතු බවට, මෙබඳු පුවත්පත් සඳහා වගකිව යුත්තන්ට උපදෙස් දීමට;

එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජනවාරි මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0241/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0429/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ක්‍රීඩා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන පිහිටුවා ඇති දිස්ත්‍රික්කවල නම් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රධාන තනතුරු දරන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) අනෙකුත් නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ උපන්දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නීතියෙන් ස්ථාපිත කර ඇති එබඳු ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එක් එක් ආයතනය සඳහා රජය මඟින් ප්‍රදානය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා ආඥාපනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා සංශෝධන පනත මඟින් (අ)(i) හි සඳහන් ආයතනවල ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට නියම කර තිබේද;

(ii) එබඳු ආයතනවල ගිණුම් සහ ක්‍රිකට් මණ්ඩලයේ මධ්‍යම ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

(iii) පසුගිය වර්ෂ 5 සඳහා ක්‍රිකට් මණ්ඩලයේ ගිණුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0537/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - හබරණ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම් ;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ අධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0785/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) මස් නිෂ්පාදනය සහ බිත්තර නිෂ්පාදනය සඳහා කුකුල් පාලනයේ යෙදෙන ගොවීන් සංඛ්‍යාව;

(ii) මාසිකව නිෂ්පාදනය කරනු ලබන බිත්තර සහ කුකුල් මස් ප්‍රමාණය;

(iii) කුකුල් පාලනය සඳහා රජය මගින් ලබාදෙන සහනාධාරයන් සහ ඒ සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ එක් එක් දිස්ත්‍රික්කයේ බිත්තර නිෂ්පාදනය හා කුකුල් මස් නිෂ්පාදනය නංවාලීම සඳහා ඉදිරියේදී රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

(ii) ඒ සඳහා එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රජය වැය කිරීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0798/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අකුරැස්ස නගරය හා ඒ අවට ගම්මාන කිහිපයකට ජල අවශ්‍යතා ඉටු කිරීම සඳහා මීට වර්ෂ පහකට පමණ පෙර විදේශ ආධාර යටතේ පානීය ජලසම්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර මුදල් ලබා දුන් රට හා මූල්‍ය ආයතනය කවරේද;

(ii) ඒ සඳහා ලැබුණු ආධාර මුදල කොපමණද;

(iii) එම ජල යෝජනා ක්‍රමය අවසන් කළ යුතු දිනය කවදාද;

(iv) එහි වර්තමාන තත්ත්වය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රතිලාභ සැලසීමට අරමුණු කරගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එමගින් ජනතාවට පානීය ජලය සැපයීමට බලාපොරොත්තු වන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0845/’10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහින්ද චින්තන වැඩසටහන යටතේ ගංගා 10ක් එක්වර සංවර්ධනය කිරීමේ යෝජනා අනුව ඇරඹි දැදුරුඔය යෝජනා ක්‍රමය අතිසාර්ථක යෝජනා ක්‍රමයක් බවත්;

(ii) දැදුරුඔය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක සෙංගල්ඔය යෝජනා ක්‍රමයේ වැඩකටයුතු මේ වන විට නතර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැදුරුඔය යෝජනා ක්‍රමය තුළින් පුත්තලම් දිස්ත්‍රික්කයේ පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම වැව්වලට අදාළ වාරිමාර්ග ක්‍රම සකස් කරන්නේද;

(iv) එම වාරිමාර්ග ක්‍රම තුළින් පුත්තලම් දිස්ත්‍රික්කයේ පෝෂණය වන වපසරිය කොපමණද;

(v) එම යෝජනා ක්‍රමය අවසන් කිරීමට ගතවන කාලය කවරේද;

(vi) මෙම යෝජනා ක්‍රමය කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0855/’10

ගරු අජිත් කුමාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වයඹ පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත විදුලි ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් ප්‍රතිපාදන වෙන් කරන ලද මූල්‍ය ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0868/’10

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්තයේ නියැලි පිරිස අතරින් විශාල පිරිසක් මාදැල් ධීවර කර්මාන්තයේ නියැලී සිටි බවත්;

(ii) සුනාමි ව්‍යසනය නිසා සියලුම මාදැල් විනාශයට පත්වූ බවත්;

(iii) කුඩා ධීවර යාත්‍රා ධීවර කර්මාන්තයට හඳුන්වාදීම මඟින් මාදැල් ධීවර කර්මාන්තය පසු බෑමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ මාදැල් ධීවර කර්මාන්තය සිදුකරනු ලබන වරායවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරායවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සුනාමි ව්‍යසනයට පෙර මාදැල් ධීවර කර්මාන්තයේ නියැලි ධීවර කාර්මිකයින්ගේ නම් සහ ලියාපදිංචි කර තිබූ මාදැල් සංඛ්‍යාව එක් එක් වරාය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සුනාමි ව්‍යසනයෙන් පසු එම ධීවර වරායන් තුළ ලියාපදිංචි මාදැල් සංඛ්‍යාව හා මාදැල් ධීවර කාර්මිකයන්ගේ නම් කවරේද;

(iii) සුනාමි ව්‍යසනය නිසා මාදැල් අහිමි වූ මාදැල් ධීවර කාර්මිකයන් සඳහා රජය ලබාදී ඇති සහන කවරේද;

(iv) එම සහන ලැබුණු අයගේ නම් කවරේද;

(v) එම සහන මෙතෙක් නොලැබුණු මාදැල් ධීවර කාර්මිකයින් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0515/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහජනතාවගේ ප්‍රවාහන පහසුකම් සැලසීමට කුලී පදනම යටතේ ධාවනයට යොදවා ඇති ත්‍රිවීල් රථ සඳහා රජය මගින් ලබාදෙන රු.1500.00ක මාසික ඉන්ධන සහනාධාරය ලැබීමට මේ වන විට ලියා පදිංචි වී ඇති හම්බන්තොට දිස්ත්‍රික්කයේ ත්‍රිවීල් රථ හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතුරින් මේ වන විට එම ඉන්ධන සහනාධාරය ලබාදී ඇති ත්‍රිවීල් රථ හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, ත්‍රිවීල් රථ අංක සහ එම සහනාධාරය පළමුව නිකුත් කල දිනයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0593/'10

ගරු රවී කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටපුරා ක්‍රියාත්මක සියළු රූපවාහිනී ආයතනවල නම් සහ ඒවායේ හිමිකරුවන්ගේ හා අධ්‍යක්‍ෂවරුන්ගේ නම් කවරේද;

(ii) එම රූපවාහිනී ආයතන වෙත නිකුත්කොට ඇති සංඛ්‍යාත සංඛ්‍යාව හා ඒවායේ නාලිකා අංක කවරේද;

(iii) එක් එක් ආයතනයේ සේවයේ නියුතු පුද්ගලයන් සංඛ්‍යාව කවරේද;

(iv) එම එක් එක් ආයතන ක්‍රියාත්මකවීම ආරම්භකළ දිනයන් කවරේද;

(v) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් රූපවාහිනී ආයතන විසින් ගෙවන ලද බදු ප්‍රමාණය කවරේද;

(vi) එක් එක් නාලිකාව මගින් ආනයනය කරන ලද විදේශ චිත්‍රපට වෙනුවෙන් පසුගිය වර්ෂ පහ තුළ ගෙවන ලද බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0786/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ශ්‍රමිකයින් සංඛ්‍යාව;

(ii) මාසිකව නිෂ්පාදනය කරනු ලබන කරදිය හා මිරිදිය මත්ස්‍ය ප්‍රමාණය;

(iii) කරදිය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා රජය මඟින් ලබාදෙන සහනාධාරයන් සහ ඒ සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ එක් එක් දිස්ත්‍රික්කයේ කරදිය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය නංවාලීම උදෙසා ඉදිරියේදී රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ වැඩසටහන් කවරේද;

(ii) ඒ සඳහා එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රජය වැය කිරීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0799/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1994 සිට මේ දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව බඳවා ගනු ලැබූ සිසුන්ගේ සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජය විසින් විවෘත විශ්වවිද්‍යාලය සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල කොපමණද;

(iii) එක් සිසුවෙකුගෙන් එක් වර්ෂයක් සඳහා අයකරනු ලබන මුදල කොපමණද;

(iv) 1994 සිට මේ දක්වා විදේශ ණය හෝ ආධාර යටතේ එම විශ්වවිද්‍යාලයට ලැබුණු මුදල් ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත කාල සීමාව තුළදී විදේශ ණය, ආධාර හා රජයේ ප්‍රතිපාදන යන ක්ෂේත්‍ර තුනෙන්ම එක් එක් වර්ෂයේදී එම විශ්වවිද්‍යාලයට ලැබුණු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1994 සිට 2009 දක්වා විවිධ පාඨමාලා යටතේ උපාධි ලබාගෙන ඇති මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපාධිධාරීන්ගේ සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පාඨමාලා අනුව උපාධිධාරියකු බිහි කිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(iv) පළාත් මට්ටමින් බිහි වූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0832/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) 2004 වර්ෂයේ ජූලි මස 22 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සිංහරාජය පුළුල් කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට තීරණය කළ වනාන්තර කවරේද;

(iii) එම වනාන්තර මේ වන විට අදාළ ආයතනය වෙත පවරාදී තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිංහරාජ වනාන්තරය වෙත ලබා දීමට තීරණය කළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් ඉඩම් මේ වන විට බදු දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් බදු දුන් ආයතනය, බදු කාල සීමාව සහ බදු ගිවිසුම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කරමින් අදාළ වනාන්තර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0846/’10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගම නැගුම ව්‍යාපෘතිය යටතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ කුඩා වැව් සංවර්ධනය කිරීමට වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) සංවර්ධනය කරනු ලබන වැව්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ, පුත්තලම් දිස්ත්‍රික්කය තුළ කුඩා වැව් සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්තුමා, ගොවිජන සේවා නිලධාරීතුමා, ගොවිජන සේවා සහකාර කොමසාරිස්තුමා හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගොවිජන සේවා අධ්‍යක්ෂක ජනරාල්තුමා වෙත යොමු කර ඇති බවත්;

(ii) අනුමැතිය ලබා ගැනීමේ එම දීර්ඝ ක්‍රියාදාමය නිසා වැව් ප්‍රතිසංස්කරණය කරනු ලබන ගොවි සංවිධානවලට වැසි කාලයට පෙර නියමිත පරිදි තම කටයුතු අවසන් කිරීමට නොහැකිව මහත් අසීරුතාවලට මුහුණ දීමට සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘති ගොවිජන සේවා නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම්තුමා මගින් පමණක් නිර්දේශ කර ගොවි සංවිධානවලට ලබාදීමටත්;

(ii) එමගින් සති 2ක් වැනි සුළු කාලයක් තුළ මෙම කුඩා වැව් යෝජනා ක්‍රියාත්මක කළ හැකි කාර්යක්ෂම වැඩ පිළිවළක් සැකසීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0856/’10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාවේදී වයඹ පළාත සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාව තුළ වයඹ පළාතේ පත්වීම් ලබාදුන් ගුරුවරුන් පිළිබඳව වාර්තාවක් සහ වසා දමන ලද පාසල් පිළිබඳ වාර්තාවක් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?